**නාඋල ප්‍රාදේශීය සභාව**
**මාතලේ දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දින සභාපතිවරයාට යවා ඇත.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම් අවලංගුකර තිබූ රු.821,907 ක් වූ සංවර්ධන ව්‍යාපෘති 2 ක වටිනාකම ණයහිමියන් යටතේ ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් ශේෂ නිවැරදිකළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ආ) | ප්‍රාග්ධන වියදම් රු.9,010,102 ක් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගතකර තිබුණි. | ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. පුනරාවර්තන ස්වරූපයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදන, මාර්ග අළුත්වැඩියාවට යොදන ලදී. |
| (ඇ) | ප්‍රාග්ධන ආධාර රු.10,275,000 ක් ආදායම් ආධාර යටතේ දක්වා තිබුණි. | ප්‍රාග්ධන ආධාර යටතේ ගිණුම්ගත කළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. පුනරාවර්තන ස්වරූපයෙන් ලැබී තිබුණු ප්‍රතිපාදන මාර්ග අළුත්වැඩියාවට යොදන ලදී. |

| | | | |
|---|---|---|---|
| **(ඈ)** | **මුද්දර ගාස්තු රු.1,939,211ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.** | **නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ.** | **නිරීක්ෂණය පිළිගනිමි. 2020 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.** |
| **(ඉ)** | **සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සදහා ප්‍රතිපාදන සළසා නොතිබුණි.** | **නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ.** | **2020 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.** |
| **(ඊ)** | **2018 වර්ෂයේදී ලැබී තිබූ රු.26,875 ක උසාවි දඩ මුදලක් ණයගැතියන් යටතේ දක්වා තිබුණි.** | **නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ.** | **2020 ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.** |

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **වර්ෂ 05 ට වැඩි කාලයක් ඉක්මවූ ලැබිය යුතු ගිණුම් ශේෂ 06 ක එකතුව රු.669,633 ක් විය.** | **ලැබියයුතු ආදායම් හා මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ.** | **නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි.** |

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **වර්ෂ 01 ත් 5 ත් අතර කාලයක් පැවති ගෙවිය යුතු ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.825,147 ක් විය.** | **ගෙවීමට ඇති මුදල් කාලීනව ගෙවීම් කළ යුතු වේ.** | **නිරීක්ෂණය පිළිගනිමි.** |

1.3.3 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1993 සිට 2010 දක්වා කාල පරාසයට අදාලව ගිණුමේ දක්වා තිබූ රු.957,380 ක යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා ලී බඩු උපකරණ භෞතිකව නොතිබුණි. | භෞතිකව හඳුනාගෙන භාණ්ඩ සමීක්ෂණ සිදුකළ යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියේදී සෑම වර්ෂයකම භාණ්ඩ සමීක්ෂණය සිදුකරමි. |

1.4 **අනුකූල නොවීම්**

**නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 24 වගන්තිය | - | සභාව මඟින් පවත්වාගෙන යනු ලබන පාරවල් සහ පටු මාවත්වල නාම ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | අදාළ ලේඛනය යාවත්කාලීන කළයුතු වේ. | ඉදිරියේදී මුදල් තත්ත්වය මත අදියර යටතේ යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති<br>රීති 218 | 29,361,722 | ඉඩම් හා ගොඩනැඟිලි සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | නීති,රීති වලට අනුව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2015 මැයි 15 දිනැති අංක 1914/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ රීති | 300,000 | විධිමත් අවසරයකින් තොරව සභා රැස්වීම් වලට සහභාගි නොවූ සභිකයින් 10 දෙනෙකුට මාසික දීමනා ගෙවා තිබුණි. | සභිකවරුන් ගේ නොපැමිණීම ලිඛිතව දැන්විය යුතු වේ. | මහා සභාවේදී ගරු සභාපතිතුමා විශේෂ නිවේදන යටතේ නොපැමිණීම දක්වා ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු **2,703,627** ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.**2,372,332** ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,787,000 | 1,621,549 | 1,339,277 | 2,416,814 | 1,787,000 | 1,655,539 | 1,488,253 | 1,571,488 |
| කඩ කුලී | 3,280,000 | 1.086,700 | 2,543,305 | 427,375 | 2,010,000 | 892,000 | 2,182,720 | 287,295 |
| බලපත්‍ර ගාස්තු | 1,060,175 | - | 1,129,565 | - | 1,010,500 | - | 1,143,740 | - |
| වෙනත් ආදායම් | 13,509,000 | 978,730 | 8,504,773 | 4,595,523 | 15,253,000 | 881,046 | 6,159,743 | 4,117,463 |
| එකතුව | 19,636,175 | 3,686,979 | 13,516,920 | 7,439,712 | 20,060,500 | 3,428,585 | 10,974,456 | 5,976,246 |

2.2.2 කඩ කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව කඩ 33 ක් 2013 න් පසු තක්සේරුකර ගිවිසුම් අළුත්කර නොතිබුණි. | ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ගිවිසුම් අළුත් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | කඩ කාමර බදු ගිවිසුමේ 22 වගන්තිය පරිදි අතුරු බදු දියනොහැකි වුවත්, කඩකාමර 11 ක් අතුරු බදු දී තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අතුරු බදුදී ඇද්දැයි නිශ්චිතව තහවුරු කර ගැනීම ප්‍රායෝගිකව අපහසු වන අතර, මේ සම්බන්ධව ඉදිරියේදී පරීක්ෂා කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සතිපොළ අංක 10 කඩ කාමරය අනවසරයෙන් දිගු කාලයක සිට බාහිර පාර්ශවයක් පදිංචිය සඳහා භාවිතා කරමින් පැවති අතර, අයවිය යුතු හිඟ කුළිය රු.82,640 ක් විය. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.607,910 ක් හා මුද්දර ගාස්තු රු.4,671,341 ක් විය. | ලැබිය යුතු ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලැබිය යුතු ආදායම් ඉදිරියේදී ගෙන්වා ගැනීමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්යසාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම
---------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්තන ආදායමින් 30% ක් වත් සංවර්ධන කටයුතු සඳහා යෙදවිය යුතුව ඇතත්, සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත 03 ක් සඳහා රු.900,000 ක මුදලක් පමණක් වැය කර තිබුණි. | පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා යෙදවිය යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක
----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP//SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා රු.70,000 ක මුදලක් වෙන්කර තිබුණ ද, අදාළ ඉලක්ක හඳුනාගෙන විධිමත් සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතු වේ. | 2020 වර්ෂයේදී අදාළ විෂයන්ට අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආරක්ෂිත ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් සහා ඉඩමක පුද්ගලයෙකු අනවසරයෙන් පදිංචි වී තිබුණි. | අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. |
| (ආ) | පසුගිය වර්ෂ 03 ක කාලයක් තුළ ගොඩනැඟිලි සංවර්ධන අයදුම්පත්‍ර 194 ක් ලැබී ඉන් අයදුම්පත්‍ර 139 ක් අනුමත කර තිබුණි. එම කාලයට අදාළව අනුකූලතා සහතික 122 ක් නිකුත් කර නොතිබුණි. | අනුකූලතා සහතික නිකුත් කිරීමට හා අනුමත නොවූ අයදුම්පත්‍ර සම්බන්ධව පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ. | අනුකූලතා සහතික ලබා නොගත් පාර්ශවකරුවන් වෙත ලිපි මඟින් දැනුවත් කර ඇත. |
| (ඇ) | 2006 වසරේදී අනුබෙදුම් කර විකුණා සහාවට වෙන්කර තිබුණු පර්චස් 34.42 ක ඉඩම් ප්‍රමාණය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කොටස නීත්‍යානුකූලව පවරා ගත යුතු වේ. | නිරීක්ෂණය පිළිගනිමි. මේ සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඈ) | ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 6 දෙනෙකුගේ ඇප තැන්පත් රු.31,022 ක් නිරවුල්කර නොතිබුණි. | ස්ථාන මරුවී ගිය නිලධාරීන්ගේ ඇප තැන්පත් නිදහස් කළ යුතු වේ. | ඉදිරියේදී නිදහස් කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | 2012 වර්ෂයේ සිට ඉදිරියට එන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය නොවූ රු.152,199 ක් අයකර ගැනීමට තිබුණි. | අයකර ගතයුතු මුදල් අයකර ගත යුතු අතර, ලිපිගොනුව අස්ථානගත වී ඇත්නම් ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදුකළ යුතු වේ. | මීට අදාළ ලිපිගොනුව සභාවේ නොමැති බැවින් උපදෙස් ඉල්ලා ලිපි ඉදිරිපත් තළයුතුව ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | හබරගහමඩ ප්‍රදේශයේ සිදුකර තිබූ ඉඩම් විකිණීමෙන් පොදු කටයුතු සඳහා ලබාදියයුතු පර්චස් 28.88 ක ඉඩම් ප්‍රමාණය වෙනුවෙන් රු.1,039,680 ක මුදලක් ඉඩම් වෙන්දේසිකරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අදාළ මුදල ගෙවන ලෙස වෙන්දේසිකරු වෙත දන්වා ඇත. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයේ සේවයෙන් පහකළ හිටපු සභා ලේකම්වරයෙකුගෙන් රු.199,920 ක ණය ශේෂයක් අය වීමට තිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට දන්වා ඇත. |

**3.4** මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හාඩුව ජල ව්‍යාපෘතිය හා 2016 වර්ෂයේදී රු.2,500,000 ක් වැයකර ඉදිකර තිබුණු සේනාගම කිණිහිර කන්ද ජල ව්‍යාපෘතිය අක්‍රීය වී තිබුණි. | ජනතාවගේ පානීය ජල අවශ්‍යතා ඉටු කිරීමට ඇති හැකියාව සොයා බලා කටයුතු කළ යුතු වේ. | දිගු කාලයක් තිස්සේ පවතින නියඟයේ බලපෑම හේතුවෙන් අක්‍රීය වී ඇත. |

**3.5 වත්කම් කළමනාකරණය**

**-----------------------------**

**3.5.1 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.7,967,144 ක් වටිනා Single drum vibrating යන්ත්‍රය 2017 වර්ෂයේ සිට නිෂ්කාර්යව තිබුණි. | අවශ්‍යතා ඇති වෙනත් ආයතනයකට ලබාදීමට කටයුතු කළ යුතු වේ. | මෙම යන්ත්‍රය යොදවා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. |

3.5.2 වාහන උපයෝජනය

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාපතිවරයා භාවිතා කරන කැබ් රථයේ 2019 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කිලෝ මීටර් 34624 ක් ධාවනය කර රු.440,033 ක් වටිනා ඉන්ධන ලීටර් 4263 ක් යෙදීමට අදාළ ගමන්වල නිවැරදිතාවය තහවුරු නොවීය. | රාජකාරි අවශ්‍යතාවය සනාථ කළ යුතු වේ. | ගමන් කළ වේලාවන් සටහන් නොකිරීම නිසා අපැහැදිළිතාවයන් ඇති බැවින් රියදුරන්ට උපදෙස් ලබාදී ඇත. |
| (ආ) | වාහනය භාවිතා කරන නිලධාරියා සහතික කිරීමකින් තොරව සභාවේ වාහන 12 ක් කිලෝ මීටර් 2226 ක් හා යන්ත්‍ර පැය 139 ක් ධාවනය කර ඉන්ධන ලීටර් 714 ක් සඳහා රු.74,797 ක් වැයකර තිබුණි. | සහතික නොකළ ගමන් සඳහා වැය වූ ඉන්ධන වියදම පිළිබඳව අවධානය යොමු කළ යුතු වේ. | අතපසුවීමකින් ධාවන සටහන් සහතික කර ගැනීමට නොහැකි වී ඇත. |

3.6 අවිධිමත් ගනුදෙනු
---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| රු.951,208 ක මුදලක් නිසි අනුමැතියකින් තොරව ගිණුම්වලින් කපාහැර තිබුණි. | අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට යොමුකර ඇත. |

3.7 හඳුනාගත් අලාභ
--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| JCB යන්ත්‍රයට 2018 නොවැම්බර් 30 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් මු.රෙ. 104(3) හා (4) අනුව අදාළ විධිමත් පරීක්ෂණයක් සිදුකර අදාළ අලාභය වූ රු.118,250 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වගකිවයුතු පාර්ශව හඳුනාගෙන අලාභය අයකර කර ගත යුතු වේ. | ප්‍රාරම්භක පරීක්ෂණයෙන් වගකිවයුත්තන් නිශ්චය කළ නොහැකි බව දන්වා ඇති අතර, පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමුකර ඇත. |

3.8 ප්‍රසම්පාදනය
--------------

කොන්ත්‍රාත් පරිපාලනය
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | නව කාර්යාල ගොඩනැඟිල්ලේ කාමර වෙන් කිරීම - රු.2,185,181 | | |
| (i) | ඉදිකිරීම් පැවරීමෙන් පසුව නැවත කර්මාන්තය සඳහා රු.2,494,503 ක වැඩ ඇස්තමේන්තුවක් සකස් තිබූ අතර එය ඉංජිනේරුවරයෙකු විසින් සහතික කර නොතිබුණි. | ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය ලබාගත යුතු වේ. | සේවා සැලසීමක් සේ සළකා ඉංජිනේරුවරයෙකුගේ නිර්දේශය ලබා ගැනීමට කටයුතු කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ii) | මිල ගණන් කැඳවීමේදී සැපයුම්කරුවන්ට ලබාදෙන ටෙන්ඩර් ලිපි ලේඛනවල තාක්ෂණ නිලධාරි පිළියෙල නොකළ අයිතම තුනකින් පමණක් සමන්විත ඇස්තමේන්තුවක් ලබා දී තිබුණි. එසේ තාක්ෂණ නිලධාරි පිළියෙල නොකළ ඇස්තමේන්තුවකට මිල ගණන් ඉදිරිපත්කර තිබූ සැපයුම්කරුගේ රු.2,017,200 ක් වූ මිල ගණන් පිළිගෙන සැපයුම්කරුගේ ඇස්තමේන්තුව අනුව කාර්මික නිලධාරි නැවත රු.2,097,880 කට ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. | ප්‍රසම්පාදන උපදෙස්වලට අනුව කටයුතු කළ යුතු වේ. | සේවා සැපයීමක් සේ සලකා මිල ගණන් කැඳවා ඇත. |
| (iii) | සැපයුම්කරුගේ මිල ගණන් වලට අනුව කාමර වෙන්කිරීමේදී ඉහලට මිලි මීටර් 4.6 වීදුරුව හා පහලට ක්ලැඩින් තහඩුව යොදා ඉදිකිරීමට වර්ග අඩියට රු.1,400 ක් අයදුම්කර ඇතත්, උඩින් හා යටින් ක්ලැඩින් තහඩුව සමඟ මැද වීදුරුවද උඩ වීදුරු හා යට ක්ලැඩින් බෝඩ් හා සම්පූර්ණයෙන්ම ක්ලැඩින් බෝඩ් ද වන ආකාර 3 කින් ඉදිකිරීම් සිදුකර තිබුණ ද අයදුම් කළ මිලටම ගෙවීම් කර තිබුණි. | ඇස්තමේන්තු ප්‍රකාරව හා කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කළ යුතු වේ. | ගෙවීම් කිරීමේදී සභා අරමුදලට පාඩුවක් සිදුවී නොමැත. |
| (ආ) | ඕපල්ගල පානීය ජල ව්‍යාපෘතිය ඉදිකිරීම<br>---------------------------------- | | |
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තියට අනුව අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව ඕපල්ගල පානීය ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදුකළ කොන්ත්‍රාත්කාර සමිතිය වෙත රු.194,800 ක අත්තිකාරමක් 2014 ඔක්තෝබර් 22 දින ගෙවා තිබූ අතර, ව්‍යාපෘතියේ ඉදිකිරීම් අත්හැර දමා තිබුණි. අදාළ අත්තිකාරම් මුදල පියවාගෙන නොතිබූ අතර, එය ගිණුම් මඟින් ද හෙළදරව් කර නොතිබුණි. | නීති, රීතිවලට අනුව කටයුතු කළයුතු අතර, අත්තිකාරම් පියවා ගැනීමටත්, ගිණුම්වල හෙළිදරව් කිරීමටත්, කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |